රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 8/90

රාජ්‍ය පරිපාලන පළාත්සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1990 - 2 - 27 වන දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත්සභා යටතට ගැනෙන ආයතන ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සහ රාජ්‍ය පෞද්ගලික සමාගම්හි සභාපතිවරුන්.

## රාජ්‍ය හා සංස්ථා අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - 1990

රාජ්‍ය හා සංස්ථා අංශයේ සේවා නියුක්තිය පිළිබඳ මීළඟ සංගණනය 1990 මැයි මසදී පැවැත්වීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විධි විධාන යොදා ඇත. මෙය රාජ්‍ය හා සංස්ථා අංශයේ සේවා නියුක්තිය පිළිබඳව පවත්වන සංගණන මාලාවේ සයවැන්නය. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මෙවැනිම සංගණන 1968, 1972, සහ 1976 වසරවලදී පවත්වන ලද අතර, 1980 සහ 1985 වසරවලදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් එම සංගණනය පවත්වන ලදි.

2. මෙම සංගණනයට අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත්සභා සහ පළාත් සභා යටතට ගැනෙන සියළුම ආයතන (පළාත් පාලන ආයතනද ඇතුළුව), රාජ්‍ය සංස්ථා සහ රාජ්‍ය පෞද්ගලික සමාගම් යන සියළුම ආයතනවල ස්ථිර, තාවකාලික, අනියම් සහ නැවත සේවයේ යෙදුනු විශ්‍රාමික යන සෑම තරාතිරමකටම අයත් සේවකයින් ඇතුලත් විය යුතුය. අදාල තොරතුරු, සේවා නියුක්තකයින් විසින් පෞද්ගලිකවම ප්‍රශ්නාවලියේ සඳහන් කළ යුතුවේ.

3. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අදාල ප්‍රශ්නාවලියේ පිටපත් ඔබ අයත් අමාත්‍යාංශය හෝ පළාත් සභාව මගින් ඔබ වෙත සපයනු ඇත. මේ සම්බන්ධයෙන්,

(අ) ආයතනයේ සියළුම සේවකයින්ට එම ආකෘති පත්‍ර බෙදා දීම,
(ආ) පුරවන ලද ආකෘති පත්‍ර ආපසු ලබා ගැනීම,
(ඇ) ඒවා සම්පූර්ණයෙන් නිවැරදිව පුරවා ඇත්දැයි පරීක්ෂාකර බැලීම සහ
(ඈ) පුරවන ලද ආකෘති පත්‍ර 1990 මැයි 15 දින වන විට ආපසු ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත එවීම, යන කරුණු සිදුකල යුතුව ඇත.

4. මෙම සංගණනය, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව මෙම අමාත්‍යාංශයට සහ වෙනත් ආයතනවලට අවශ්‍යවන තත්කාලීන දත්ත සහ තොරතුරු ලබාගැනීමෙහිලා අතිශයින් වැදගත් වේ. එහෙයින් ඉහත සඳහන් කොට ඇති කාර්යයන් නිසි අයුරු ඉටු කිරීමට සහ ඔබගේ ආයතනයේ සියළුම සේවකයින්ගෙන් සම්පූර්ණ තොරතුරු ලබාගැනීමට අවශ්‍ය විධිවිධාන සලස්වන මෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමි.

පී. එන්. එම්. ප්‍රනාන්දු.
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත්සභා සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

පිටපත් : 1. අධ්‍යක්ෂ - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
2. ලේකම් - සැලසුම් සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය.